බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය
Tel: +94 025 2222367
**E-mail: mahaviharasl@gmail.com**
**Web: http://www.srimahabodhi.lk**

# 2017
# වප් පොහෝදින
# ධර්ම දේශනා 1



බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය

# 2017

## ඓතිහාසික අනුරාධපුර මහා විහාරයේ

## වප් පුන් පොහෝ දිනසන්නිපාත ශාලාවේපැවැත්වූ

## මජ්ඣිම නිකායේ

## මූලපණ්ණාසකයේ සාලෙය්‍යක සූත්‍රය ඇසුරින්

## ධර්ම දේශනය


**දේශකයාණෝ**

පූජ්‍ය කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි

කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය



බෝ මළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය.

Tel: +94 025 2222367
E-mail: mahaviharasl@gmail.com
Web: http://www.srimahabodhi.lk

**පුණ්‍යානුමෝදනාව**

පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ
අටමස්ථානාධිපති

## මජ්ඣිම නිකායේ මූලපණ්ණාසකයේ සාලෙය්‍යක සූත්‍රය ඇසුරින් ධර්ම දේශනය

සාධු ! සාධු !සාධු !

**<u>දේවාරාධනය....</u>**

සමන්තා චක්ක වාලේසු

අත්‍රා ගච්චන්තු දේවතා

සද්ධම්මං මුනිරාජස්ස

සුනන්තු සග්ග මොක්ඛදං

**<u>කාල ඝෝෂණය...</u>**

ධම්මස්වසන කාලො - අයං භදන්තා

ධම්මස්වසන කාලො - අයං භදන්තා

ධම්මස්වසන කාලො - අයං භදන්තා

**<u>නමස්කාරය...</u>**

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

පිංවත්නි,

අති ගෞරවනීය නායක ස්වාමීන්වහන්සේ, ඒ වගේම උඩමලුව විහාරස්ථවාසී, අපේ ඥාණසිරි හාමුදුරුවෝ, සිරිරතන හාමුදුරුවෝ, සුමනසිරි හාමුදුරුවෝ ප්‍රමුඛ ගෞරවනීය මහා සංඝරත්නයෙන් අවසරයි! මේ උතුම් පුර පසළොස්වක පොහොය දවසේ අෂ්ඨාංග සීලය සමාදන්ව හා, ධර්මශ්‍රවණාභිලාෂීව සන්නිපාත ශාලාවේත්, ඉන් පිටතත්, ඒකරාශීව සිටින, ශ්‍රද්ධා බුද්ධි සම්පන්න, ධර්මශ්‍රවණලාභී, කාරුණික, වාසනාවන්ත පිංවත්නි, අපේ සම්බුද්ධ ශාසනයේ ඓතිහාසික භූමියේ අෂ්ඨාංග උපෝසත සීලය සමාදන් වූ පිංවතුන් හැටියටයි.මේ ස්ථානප්‍රාප්ත වූ ඔබ මේ අනුශාසනාව ශ්‍රවණය කරන්නේ.

වප් පුර පසළොස්වක පොහොය දවස ඓතිහාසික, ශාසනික සිදුවීම් රාශියක් නිසා අපිට ඉතාම වැදගත් වන පුර පසළොස්වක පොහොය දවසක්. විශේෂයෙන්, අරිට්ඨ කුමරු ඇතුළු පිරිස විජයශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා ගැනීම සඳහා පිටත් වුණේ අද වගේ පුර පසළොස්වක පොහොය දිනක. ඒවගේම ථූපාරාමය

කේන්ද්‍ර කරගෙන සිදුවූ විනය සංගායනාව සිදුවුණෙත් අද වගේ පුර පසළොස්වක පොහොය දවසක.

මෙවන් සුවිශේෂී ශාසනික, ජාතික කාරණාවන් රාශියකට මුල්වන, පසුගිය ඇසළ පුර පසළොස්වක පොහොය දිනයේ වස් කාලසීමාව ආරම්භව, වස් විසූ උපසපන් භික්ෂූන් වහන්සේලා, වස් පවාරණය කරන වගේම කඨින චීවර මාසය ආරම්භ කරන පොහොය දවස තමයි, වප් පුර පසළොස්වක පොහොය දවස. මේ ඇත්තෝ ඒ සුවිශේෂී පොහොය දවසේ තමන්ගේ ශීලමය ජීවිතයත්, ඒ තුළින් ගොඩනැගෙන කර්ම ශක්තියත් සංවර්ධනය කරගැනීම පිණිස අද ඉතාම උවමනාවෙන්, මේ ධර්ම දේශනාව ශ්‍රවණය කිරීම සඳහා ඒකරාශීව තිබෙනවා. මා තෝරා ගන්නට යෙදුණු ඒ ගාථා ධර්මයට අනුව, අපේ අනුශාසනාව පවත්වන්නට කලින් පූර්විකාවේ සඳහන් කළ යුතු යම් යම් කරුණු කිහිපයක් තිබෙනවා.

පිංවත්නි, ඔබ අද සහභාගී වන්නේ ලංකාවේ ජනප්‍රිය පිංකමකට. ඒක තමයි, බණ දෙසීම හා බණ ඇසීම. අද ලංකාවේ තියෙන 20ක ට අධික රූපවාහිනී නාලිකා හා 43ක ට අධික ගුවන්විදුලි නාලිකා බොහෝමයක උදේ ඉඳලා හවස් වෙනකන්, ධර්ම දේශනා තියෙන්නේ. ඒ

වගේම, මේ අටමස්ථානය, මහනුවර, දකුණු පළාතේ යම් යම් ස්ථානවල හා ලංකාවේ විවිධ ස්ථානවල සිය දහසක් පිරිස එකතුවෙලා බණ අහනවා. පිංවත්නි, බණ කියන්නේ කුමක්ද කියලා අටුවාවේ, එක තැනක විවරණයක් තියෙනවා.

බණ කියන්නේ, හොඳයි, නරකයි. "භ සුන්දරං". "භ කියන්නේ හොඳ සුන්දර දෙයක්. "න" කියන්නේ නරක දේවල්. එතකොට බණ අහනවා කියන්නේ මොනවා අහන එකටද? හොඳ සහ නරක අහන එකට. ඇයි මේ නරක අහන්නේ? නරක අයින් කරන්න අපි නරක දැනගෙන ඉන්න ඕනේ. දැන් පොඩි දරුවෙක් හොඳ, නරක දන්නේ නෑ. ඒ නිසා එයාලා ක්‍රියාවන් තෝරන්නේ නැතිව, තමන්ට හිතෙන ක්‍රියාව නිදහසේ කරනවා.

හැබැයි, අපි ධර්මයෙන් පෝෂණය වෙනකොට, ධර්මය ඉගෙන ගන්නකොට, වැඩිහිටියෝ බවට පත්වෙනකොට, පිංවතුනි අපි හොඳ, නරක තෝරගන්න පටන් ගන්නවා. දැං හොඳ, නරක දැනගන්න නම් බණ අහන්නේ, හොඳ නරක විදිහට ඉන්න නම් බණ අහන්නේ, අද ලංකාවේ මිනිස්සු බණ අහන තරමටම හොඳ නරක අනුව

ඉන්නවද? හාමුදුරුවෝ, බණ කියන එක නතර කරලත් නෑ, බණ අහන මිනිස්සු නරක වැඩ කරන එක නතර කරලත් නෑ.

පිංවතුනි, දැන් බණ අහනවා කියන්නේ, අර අපිට තියනවා වචනයක්, Popular Buddhism කියලා. ඒ කියන්නේ, ජනප්‍රිය බුදුදහම. ලංකාවේ ගොඩක් පූජාචාරීන්ට බණ ඇසීම කියන්නේ, ජනප්‍රිය බුදුදහමේ තියන එක අභිචාරී විදිහක් විතරයි. බණ අහන එක, එක විලාසිතාවක් සමහර අයට. සිල් ගන්න එක විලාසිතාවක්, භාවනාවට යන එක නම් විලාසිතාවක් ම වෙලා තියෙනවා.

පිංවතුනි, මේ දේවල්වල හරය ඒ යන බොහෝ දෙනෙක්ගේ ජීවිත තුළ නැහැ. අපි භාවනා කරන්න යන ගොඩක් දැකලා තියෙනවා. ඔහු හෝ ඇය තරම් අනිත් අයව පහත් කරලා සලකන්නේ නෑ කවුරුවත්. සෙය්‍යයමානය. එතකොට නැති කෙලෙසුත් සමහර අය ඇති කරගන්නවා මේ ආගමික වැඩ කරන්න ගිහිල්ලා. සිල් ගන්න අය සිල් නොගන්න අය කෙරෙහි ද්වේෂ සහගත වෙනවා, "අපි හැමදාම සිල්ගන්නවා. මේ ගොල්ලෝ කවදාවත් ගිහින් සිල් ගන්නේ නෑ".

එතකොට අපේ කුසලය, අපේ යහපත අපි පාවිච්චි කරලා තියෙන්නේ මේ මනසින් තවත් අකුසලයක් ඇති කරගන්නද? කුසලයක් ඇති කරගන්නද? අකුසලයක් ඇති කරගන්න. පිංවතුනි, ධර්ම දේශනා ශ්‍රවණය කිරීමේ තත්ත්වයත්, ඒකයි ඇත්තටම.

බලන්න හැමදාම මිනිස්සු සියදිවි නසා ගන්නවා. වංචාව. දූෂණය, හොරකම ඉහවහා ගිහින් තියෙනවා. ඉතින් මෙච්චර බණ අහන රටේ මේවා අඩුවෙන්න ඕන. නමුත්. වෙන්නේ හැමදාම වැඩිවෙන එක. මොකක්ද ඒකට හේතුව? හේතුව තමයි බණ ඇසීමේ අරමුණ මොකක්ද කියලා බණ අහන ගොඩක් අය දන්නේ නැහැ. ඒ නිසා, ඔබට මේ වප් පුර පසළොස්වක පොහොය දවසේ ඉඳලා බණ අසන අරමුණ වෙනස් කරගන්න පුළුවන් නම්, හාමුදුරුවෝ ධර්ම දේශනාවට කලින් ධර්ම අවවාදයක් දෙනවා. අපි හැමදාම අහලා තියෙනවා, සිත, කය, වචනය යන තුන්දොර සංවර කරගෙන බණ අහන්න ඕන කියලා.

අද මං පිංවතුනි, ඒකට පුංචි කතාවක් කියනවා. එක දවසක් ජපානේ සෙන් ගුරුවරයෙක් (හාමුදුරු කෙනෙක්)හම්බවෙන්න එක දායක මහත්තයෙක් ආවා.

මේ දායක මහත්තයා ඇවිල්ලා, හාමුදුරුවන්ගෙන් ඇහුවා,
"ස්වාමීනී, ඔබ වහන්සේ අපිට කොයි වෙලෙත් බණ අහන්න කියනවා, බණ පොත් කියවන්න කියනවා. ධර්මයත් එක්ක ඉන්න කියනවා. ධර්මයට අනුව හැසිරෙන්න කියනවා. ස්වාමීනී, ඔබ වහන්සේගේ කීම අහලා මම අවුරුදු ගාණක් බණ ඇසුවා. ස්වාමීනි, ඔබ වහන්සේලා කියන විදිහට බණ අහලා නම්, ඔය ලැබෙනවායි කිව්ව මොකවත් මට ලැබිලා නෑ".

අපේ අය ධර්ම සාකච්ඡාවලදි නම් අහනවා, හාමුදුරුවනේ, බුදුහාමුදුරුවන්ගේ කාලේ බණ අහපු අය රහත් වුණාලු. සෝවාන් වුණාලු. බුදුරජාණන් වහන්සේගේ කාලයට වැඩිය දැන් බණ කියනවා. කෝ මොකවත් නෑ කාටවත්. ප්‍රශ්නේ තියෙන්නේ පිංවත්නි, බණ අසන විදිහේ හා බණ අසන අරමුණේයි.

"ස්වාමීනි, ඔබ වහන්සේ මට අද කියලා දෙන්න ඕන, මිනිස්සු බණ අසන්නේ මොකටද කියලා. නැත්නම්, මං අද ඉඳන් බණ අසන්නේ නෑ."

දැං හාමුදුරුවන්ට පුදුම ප්‍රශ්ණයක් එල්ල වුණේ. පිංවතුනි, සෙන් ගුරුවරු හා සෙන් දහම, බුදුදහමේ ඉතා ගැඹුරු දාර්ශනික හරය, ඉතා සරලව පහදලා දෙන දර්ශනයක්, සෙන් කියවන්න ඕන.
මේ මනස දියුණු කරපු හාමුදුරුවෝ, උන්වහන්සේගේ ගිනිහල්ගෙට ගිහිල්ලා, ලුණු අහුරක් අරන් ආවා.

මොකක්ද පිංවත්නි මේ ගිනිහල්ගේ කියන්නේ. කුස්සිය. කුස්සිය තමයි ගිනිහල්ගේ කියන්නේ. අපිට ශාසනික සම්ප්‍රදායේ ලස්සන වචන ටිකක් තියෙනවා.

ගිනිහල්ගෙට ගිහිල්ලා, ලුණු අහුරක් අරන් ආවා, උන්වහන්සේගේ අත පිරෙන්න. බණ අහන්න ඕන මොකටද කියලා අහපු දායක මහත්තයාගේ අතට දුන්නා ලුණු ටික. දැන් දායක මහත්තයා තුෂ්නිම්භූත වෙලා බලන් ඉන්නවා, වෙන්න යන්නේ මොකක්ද කියලා. ප්‍රශ්නය ඇසුවේ බණ අහන්න ඕන මොකටද කියලා. දැන් ලුණු කන්න වෙන වගේ ගතියක් තමයි තියෙන්නේ.

හාමුදුරුවන්ට වළඳන්න වතුර වීදුරුවක්දීලා තිබුණා. හාමුදුරුවෝ මේ වතුර වීදුරුව දුන්නා දායක මහත්තයාගේ අනෙක් අතට. දීලා කිව්වා, දැන් මම

දුන්න ලුණු අහුර ඔබ වතුර වීදුරුවට දාලා දිය කරන්න කියලා. දායක මහත්තයා ලුණු ටික ඔක්කොම දාලා දිය කළා. දිය කරලා ඉවර වුණාම කිව්වා දැන් ඕක බොන්න.

ආ, මට කියන්න බලන්න ලුණු අහුරක්ම වතුර වීදුරුවක දාලා දිය කළාම ලුණු වැඩිද අඩුයි ද? ලුණු වැඩියි. ඒක ලුණු රස නෙමෙයි, ලුණු ම ලුණු රස. දායක මහත්තයා මේක බොන්න හදනකොටම දන්නවා, මේකෙ හොඳටම ලුණු වැඩියි. බොන්න පුළුවන් වතුර වීදුරුවක් නෙමෙයි කියලා. හාමුදුරුවෝ කිව්වාම කරන්නත් එපැයි. බොහොම චුට්ටක් බිව්වා. බිව්වේ නෑ. ඒකත් කටට අරගෙන එහෙම්මම බිමට දැම්මා.

හාමුදුරුවෝ ඇහුවා, "ඇයි?" කියලා. "ස්වාමීනී, මේක මනුස්සයෙකුට බොන්න තියා කටටවත් කිට්ටු කරන්න බෑ. ලුණු රසයි හොඳටම, මම ඔබ වහන්නේගෙන් අහන්නේ මිනිස්සු බණ අහන්න ඕන ඇයි කියලා. ඔබ වහන්සේ මට ලුණු දියර බොන්න දෙනවා. කරුණාකරලා මගේ ප්‍රශ්නෙට උත්තරයක් දෙන්න".

හාමුදුරුවෝ ආපහු ගිනිහල්ගෙට ගිහිල්ලා ගෙනාවා, ඊට වැඩිය ලොකු ලුණු අහුරක්. ගෙනල්ලා දුන්නා දායක මහත්තයාගේ අතට. දායක මහත්තයා දන්නවා, දැන් මේකත් වීදුරුවට දාලා ලුණු අහුරු දෙකක් දිය කරලා බොන්න වෙනවා කියලා.

වීදුරුවට දාන්න හදනකොටම දායක මහත්තයා ට හාමුදුරුවෝ කිව්වා, "නෑ, ඔබ අරගෙන යන්න ඔය ලුණු අහුර අපේ ආරාමෙට පිටිපස්සෙන් ගලන ගඟ ගාවට. ගිහිල්ලා දාන්න ලුණු අහුර ගඟට. යම් වෙලාවක ඔබට හිතුනොත්, ලුණු අහුර දැන් දියවෙලා කියලා, බොන්න දිය දෝතක්. ඇවිල්ලා කියන්න මට, රසය මොකක්ද කියලා."

පිංවත්නි, දායක මහත්තයා ගිහින් ලුණු අහුර ගඟට දාලා දියවෙලා ඇති කියලා හිතෙනකන් හිටියා. ඉඳලා, බිව්වා ගඟෙන් දිය දෝතක්. පිංවත්නි, ගඟ මොන රහද? ගඟ ලුණු රහද? ලුණු අහුරක් දැම්මට ගඟක් ලුණු රහ වෙනවාද? වෙන්නේ නෑ. ආපහු දායක මහත්තයා ඇවිත් කිව්වා, "ස්වාමීනි, ගඟ නම් ලුණු රහ නෑ, ගඟෙන් වතුර බොන්න පුළුවන්". හාමුදුරුවෝ මොකක්ද කිව්වේ,

**"මිනිස්සු ගඟක් වෙන්න තමයි බණ අසන්න ඕනේ".**

ධර්මය නැති කෙනාගේ ජීවිතය වතුර වීදුරුවක් වගේ. උදේ ඉඳලා වැටෙන ලුණු අහුරුවලින් ලුණු රස වෙන එක නෙමෙයිද අපි කරන්නේ. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස කියන මේ ප්‍රධාන ඉන්ද්‍රියයන් හයට චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන කියන ප්‍රධාන වශයෙන් අරමුණු 6ක් එනවා, ෂඩ් ඉන්ද්‍රියයන්ට. මේ හයෙන් උදේ ඉඳන් හවස් වෙනකන් මේ ආපු අරමුණු එක්කෝ සුඛ වශයෙන් අල්ලා ගන්නවා. එක්කෝ දුක්ඛ වශයෙන් අල්ලා ගන්නවා.

සුඛ වශයෙන් අල්ල ගත්ත ඒවා කාලයක් යනකොට ලුණු රස වෙනවා. දැන් සුඛ වශයෙන් අල්ලා ගත්ත අයට ලුණු රස වෙලාද නැද්ද කියලා කල්පනා වෙනවා ඇති. දුක්ඛ වශයෙන් අල්ලා ගත්ත ඒවා ඒ වෙලාවෙම ලුණු රස වෙනවා. අන්න අහවලා බැන්න කිව්වහම, අපි ලුණු රස වෙනවද, නැද්ද? ලුණු රස වෙනවා.

උදේ ඉඳලා රෑ වෙනකන්... එන කෙලෙස් කන්දකට යටවෙලා ද්වේශය, මානය, ක්‍රෝධය, උද්දච්ඡකම ආදී කෙලෙස් ගොඩක පැටලෙනවා. ඇයි එහෙම වෙන්නේ?

අපේ ජීවිතේ ධර්මය නෑ. ධර්මය නැති කෙනාගේ ජීවිතය ඉතාම ඉක්මනින් ලුණු රස කරන්න පුළුවන්. ධර්මය තියෙන කෙනාගේ ජීවිතය පිංවතුනි, ගඟක් වගේ.

ඇයි, ගඟක් වගේ කියන්නේ?

පිංවතුනි, ලුණු අහුරක් දැම්මට ගඟ ලුණු රස වෙන්නේ නෑ. ගඟට මිනිස්සු කොච්චර කරදර කරනවද? ඇළවල් බඳිනවා, වේළි බඳිනවා, හරස් කරලා වැව් හදනවා, ජල විදුලි බලාගාර හදනවා. අපේ ඇඳුම්වල තියෙන කුණු කිළිටි ඔක්කෝම ගිහිල්ලා හෝදනවා. ගඟ දෙපැත්තේ තියෙන ආයතනවල, හෝටල්වල, ගෙවල්වල අපවිත්‍ර පද්ධති ඔක්කොම මිනිස්සු ගඟට හරවනවා. ගඟක් ලුණු රහ වෙනවද? ගඟක් ලුණු රහ වෙනවද? ඔය මොන බැම් බැන්දත්, පිංවතුනි ලෝකේ මොන ගඟද ගලන එක නතර කළේ? මල්වතු ඔයෙන් වැව් කීයක් හදලා තියෙනවද? නමුත් මල්වතු ඔය තාම තියෙනවා. මහවැලි ගඟෙන් විදුලි බලාගාර කීයක් හදලා තියෙනවද, මහා බැම් බැඳලා? හැබැයි මහවැලි ගඟ මුහුදට හැමදාම ගලාගෙන යනවා.

අපේ ජීවිතය හරස් කරලා කෙලෙස් නැමැති බාධක බඳිනවා. අපිට ලුණු අහුරු ගෙනැල්ලා දානවා. අපිව හරස් කරලා බැමි බඳිනවා. අපෙන් කාණු කපලා වතුර එළියට ගන්නවා. අපිට අපවිත්‍ර දේවල් ගෙනත් දායි. හැබැයි, ඒ සියලු අභියෝග හමුවේ ගඟක් වගේ නොසෙල්වී ගලන්නයි මිනිස්සුන්ට ධර්මය ඕනේ. ධර්මය තියෙන කෙනා මොන බාධකය ආවත් ගඟක් වගේ ගලාගෙන යනවා.

ලෝකයේ හැම ගඟකටම එක අරමුණක් තියෙනවා. මොකක්ද? මුහුදට වැටෙන්න. පිංවතුනි, අපිටත් තියෙනවා අන්තිම අරමුණක්. මොකක්ද? නිවන් සාක්ෂාත් කරගන්න. ඒ නිසා අද ඔබ ශ්‍රවණය කරන ධර්මානුශාසනාව, ඔබේ ජීවිතයද මහා ගංගා ප්‍රවාහයක් බවට පත්කොට මහ මුහුද නැමැති, නිවන වෙත ගලා යනු පිණිස ම හේතු වාසනා වේවා කියා සාධුකාරයක් පවත්වන්න.

සාධූ ! සාධූ !සාධූ !

පිංවත්නි, බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවාසය කරද්දී, ඒ ආසන්නයේ තිබුණා සාල කියලා ගමක්. මේ ගම යම් යම් දේ දැන උගත් යම් යම් ශාස්ත්‍රයන් ප්‍රගුණ කළ, බමුණෝ හිටිය ගමක්. බුදුහාමුදුරුවෝ මේ ගමට වැඩියා කියලා ආරංචි වුණාම, බුදුහාමුදුරුවෝ මුණ ගැහෙන්න මේ ගමේ දායක මහත්තුරු ටික කතා වෙලා ආවා.

"බුදුහාමුදුරුවෝ වැඩියම අපිට විශාල අවස්ථාවක් තියෙනවා අපේ ජීවිතයේ තියෙන ගැටලු විසඳගන්න. ඒ නිසා අද අපි, බුදුහාමුදුරුවෝ මුණ ගැහෙන්න යමු" කියලා මේ දායක මහත්තුරු ඔක්කොම බුදුහාමුදුරුවෝ මුණ ගැහෙන්නට ආවා. ඇවිල්ලා, බුදුහාමුදුරුවන්ගෙන් ඇසුවා, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සමහර අය මැරිලා අපායේ යනවලු. සමහර අය මැරිලා දිව්‍යලෝකේ යනවලු".

"පරං මරණං දුග්ගතිං නිරයි වේ පාතං
පරං මරණං සුගතිං සංගතේ රං"

"සමහරු උඩහට යනවා. මැරිලා, සමහර පහළට යනවා. "ස්වාමීනී, එකම සමාජ තලයක හිටපු මිනිස්සු මැරිලා

අපායේ යන්නයි, නරක තැන්වල ඉපදෙන්නයි, මැරිලා ඉහළට යන්නයි, ඉහළ තැනක ඉපදෙන්නයි, හේතුව මොකක්ද?"

මේ ප්‍රශ්නෙට පිළිතුරක් විදිහට බුදුරජාණන් වහන්සේ, " දුෂ්චරිත දහයක් සහ යහපත් ක්‍රියාවන් දහයක් නිසා මිනිස්සු සුගතියේ හා දුගතියේ ඉපදීම තීරණය කරන බව" දේශනා කළා. මෙහිදී පිංවත්නි, මිනිස්සු සුගතියේ හා දුගතියේ ඉපදෙන්න බලපාන හේතු සාධක කිහිපයක් තියෙනවා. ඒ අතරින් විශේෂ වශයෙන් කායික දුෂ්චරිත, මානසික දුෂ්චරිත, වාචික දුෂ්චරිත, කායික සුචරිත, මානසික සුචරිත, වාචික සුචරිත තිබෙනවා.

පිංවත්නි, කායික දුෂ්චරිත - අපි, අපේ කය පාවිච්චි කරලා කරන දුෂ්චරිත තුනක් තියෙනවා. මොනවද මේ කායික දුෂ්චරිත?

- ප්‍රාණඝාතය
- අදත්තාදානය
- කාමමිච්ඡාචාරය

ප්‍රාණඝාතය කියන්නේ සතුන් මරණ එක. ඕනැම පණ ඇති සත්වයෙක් ඝාතනය කරන්නා, මරණින් මතු සතර

අපායෙයි ඉපදෙන්නේ. දැන් ගොඩක් අයට තියන ප්‍රශ්නය තමයි, සියදිවි නසාගැනීම ප්‍රාණඝාතයක් ද? ඔව් ප්‍රාණඝාතයක්. මේ දවස්වල ඉතාම ජනප්‍රියයි සියදිවි නසාගැනීම.

පිංවතුනි, අපේ ධර්ම විග්‍රහයට අනුව, දීර්ඝ කාලයක් මනුෂ්‍යයෙක් වෙලා ඉපදෙන්න බෑ. අපිට අපිවත් විනාශ කරගන්න අයිතියක් නෑ. මේක අපේද? නෑ. අපේ නම්, මේ අම්මලා කොණ්ඩේ ඉදෙන එක නතර කරගන්නවද?නැද්ද? නතර කරගන්නවා. අපේ නම්, අපට පුළුවන්නේ නතර කරගන්න. දත්ටික හැලෙන එක. අපි ලස්සනට ඉඳලා අවලස්සන වෙන එක අපට නතර කරගන්න පුළුවන්. මේක අපේ නෙමෙයි. ඒක නිසා, තමා විසින් තමාව ඝාතනය කිරීමේ සිට, පණ ඇති පුද්ගලයෙකු සත්වයෙකු ඝාතනය කිරීම, පරපණ නැසීමක්. මේවා අපි දන්නවා.

මේ කාරණා දහයම දීර්ඝ වශයෙන් විස්තර කරන්න වේලාවක් නැහැ. හැබැයි විස්තර කරනවා ප්‍රධාන වශයෙන් අත්‍යාවශ්‍ය කරුණු දෙකක්. එකක් තමයි. මේ වාචසික වැරදි. දෙක තමයි මිත්‍යාදෘෂ්ටිය. ඊළඟට

අදත්තාදානය. අදත්තාදානය කියන්නේ නොදුන්න දේ ගැනීම.

පිංවතුනි. චක්‍රවර්ති සූත්‍රය විස්තර කරන ආකාරයට ලෝකයේ පළවෙනි වැරැද්ද මොකක්ද? හොරකම. අපි හිතං ඉන්නවා ප්‍රාණඝාතය කියලා. ප්‍රාණඝාතය තියෙන්නේ, ඊට ගොඩක් පස්සේ.
"අදත්තාදාන, අනුපදී මානී, දෘනින්දියන් මේ පුල්ලමගවාසී දානින්දියන්"

ඉස්සර පිංවත්නි, අපිට තිබුණේ පුද්ගලික දේපල ක්‍රමයක් නෙමෙයි. පොදු දේපල ක්‍රමයක්. දැන් අපිට තියෙන්නේ මොන දේපල ක්‍රමයක්ද? පුද්ගලික දේපල ක්‍රමයක්. දැන් අපි ලංකාව ගමු. ලංකාවේ ඉන්න හැමෝටම වැටක් තියෙනවා. වැටක් නැති ඉඩමක් තියෙනවද? අපිට වැටක් තියෙනවා. අපිට බැම්මක් තියෙනවා. ඒ බැම්ම ඇතුළේ ගෙයක් තියෙනවා. ඒ ගේ ඇතුළේ කාමරයක් තියෙනවා. ඒ කාමරය ඇතුළේ පුංචි පුංචි බඩු මුට්ටු ටිකක් තියෙනවා.

දැං අපි වැටක් ඇතුළේ ගෙයක් හදාගෙන, ගේ ඇතුළේ කාමරයක් හදාගෙන, කාමරේ ඇතුළේ ජංගම

දුරකථනයක සිරකරුවෝ බවට පත්වෙමින් ජීවත් වෙනවා. ලෝකයේ මිනිස්සු, තම තමන්ගේ වගා බිම්, පොදුවේ භුක්ති විඳගෙන ජීවත් වුණා. එක දවසක් පිංවතුනි, එක මනුස්සයෙක් කල්පනා කළා, මට කියලා ටිකක් වෙන් කරගත්තොත්. අද කෑම තියෙනවද, නැද්ද කියලා අවිනිශ්චිත තත්ත්වයකට මා එන්න ඕන නෑ කියලා. පිංවතුනි, වැටක් ගැහුවා. මේක දැකලා අනිත් මිනිස්සුත් ඇවිල්ලා, ඔක්කෝමලා වැටවල් ගහන්න පටන් ගත්තා. පිංවතුනි, දැන් වැටවල් ගහන එක කොච්චරද කියනව නම්, අපි ගන්නේ පර්චස් 30යි ඉඩම... වැට ගහගන්නවා පර්චස් 40ක ට. ගේ හදන්න අත්තිවාරම කපනකොට, ගේ ඉස්සරහ තියෙන කාණුවට පස් ටිකයි, ගල් ටිකයි දාලා, කාණුව ගොඩකරලාතමයි බැම්ම ගහන්නේ. පිංවතුනි, මම දන්නේ නෑ මේ ලෝකේ වෙන මිනිස්සු ඉන්නවද කියලා ඉඩම්වලට මෙච්චර පෙරේත.

අද ගෙදර ගිහිං කල්පනා කරන්න. ලයිට් කණුව තියෙනවනම්, බැම්ම ඇතුළේ, ඔබ හොරෙක්. ඔබේ බැම්ම ඇතුළේ ලයිට් කණුව තියෙනවා නම් ඔබ හොරෙක්ද? නැද්ද? ඔබ හොරෙක්. ඔබේ බැම්ම

ඇතුළේ ටෙලිෆෝන් කණුව තියෙනවා නම්, ඔබ හොරෙක්ද නැද්ද? ඔබ හොරෙක්. ඔබ රාජ්‍ය දේපල හොරකම් කරලා.

පිංවතුනි, කෝටි ප්‍රකෝටි ගණන් ධනය තියෙන, තට්ටු හතරෙ, පහේ ගෙවල් ගහපු මිනිස්සු, ලයිට් කණුවත් මිදුලට දාලා තමයි බැම්ම බැඳලා තියෙන්නේ. පිංවතුනි, ලෝකේ මිනිස්සුන්ට භුක්ති විඳින්න තියෙන පොදු දේ ගන්න එක හොරකමක්. අපි මේ සාම්ප්‍රදායික හොරකම් ගැන හැමදාම කතා කරනවනේ. ඔබට අයිති ද ලයිට් කණුව, ටෙලිෆෝන් කණුව තියෙන භූමිය? ඔබේ ගේ ඉස්සරහ තියෙන පාර අඩි 16ක පාරක් නම්, දැන් තියෙන්නේ අඩි 12ක් නම්, ඔබ අඩි 4ක හොරෙක්.

ඔබ උදේ 08.00 ට වැඩට යන්න ඕනෙ. ඔබ 09.00 ට ගිහිල්ලා 08.00 යි කියලා අත්සන් කරනවා නම්, ඔබ වංචා කරලා. ඔබේ රැකියාවට. ඔබ වැඩ ඇරිලා ගෙදර යන්න ඕන 04.00. හැබැයි, ඔබ ගෙදර යන්නේ 03.00ට නම්?

දරුවෙක්ගෙන් ඇහුවලු, ලෝකේ වේගවත් ම මිනිසා කව්ද කියලා.

කවුද සමුගත්තේ ක්‍රීඩාවෙන්, මේ ඊයේ පෙරේදා? වේගවත්ම මිනිසා මිහිපිට. හුසේන්බෝල්ට්, අන්තිම තරගයේ දී පරාද වෙනවා.තරග දෙකම. මා හිතන්නේ. නමුත් දිනපු කෙනා, අමෙරිකානු ක්‍රීඩකයා, බෝල්ට්ව පරාද කරන්න අවුරුදු ගාණක් උත්සහ කළා. ඔහුට ඇවිත් හිස නමනවා.එකෙන් පණිවිඩයක් දුන්නා, ලස්සන. "විශිෂ්ටයන් පරාජයට පත්කළ හැක. නමුත්, විශිෂ්ටත්වය පරාජයට පත් නොවේ". ඕනෑම කෙනෙක් තව කෙනෙකුට පරදින්න පුළුවන්, නමුත්, විශිෂ්ටත්වය පැරදෙන්නේ නෑ පිංවතුනි. ඒක හැමදාම එහෙමම තියෙනවා.

ළමයා කිව්වලු, "ලෝකේ වේගවත්ම කෙනා අප්පච්චී" කියලා. හේතුව තමයි, හවස 04.00ට තමයි වැඩ ඇරෙන්නේ. අප්පච්චි 03.00ට ගෙදර එනවා. එතකොට පිංවතුනි, බෝල්ට්ටත් වඩා වේගයක් තියෙනවා, සමහර අප්පච්චිලා, අම්මලාට.

නමුත් ලෝකයේ රටවල් දියුණු වුණේ, රාජ්‍ය හෝ පුද්ගලිකව, තමාට ලැබෙන වැටුපට හොරකම් නොකරපු රටවල්. පිංවතුනි, අපි 03 ඉඳලා ඇඟිලි සලකුණු

යන්ත්‍රය ඉස්සරහා. පිංවතුනි, අපි බණ කියන්නේ, මිනිස්සුන්ට, රටට. ඒ නිසා, අපි මේ බණ කියන්න ඕන. රටක්, සමාජයක් වශයෙන් සංවර්ධනය වෙන්න.

මොකද, අපි හැමදාම හිතන්නේ අපි ඔය අනුන්ගේ කෙහෙල් කැන් කපන්න යන්නේ නෑනේ. ඉතිං අපි හොරු නෙමෙයි. හැබැයි එතකොටත් ලයිට් කණුව අපේ බැම්ම ඇතුළේ.

අපි ඔය අනික් අයගේ පර්ස් එකේ තියෙන සල්ලි හොරකම් කරන්න යන්නේ නෑනේ. හැබැයි එතකොටත් ටෙලිෆෝන් කණුව බැම්ම ඇතුළේ. අපි අනික් අයගේ ගෙවල්වලට පැනලා එක එක දේවල් හොරකම් කරන් එන්නේ නෑ නේ කියනවා. හැබැයි. ඒ වෙනකොට ඔබට අයිති නැති පාරේ කාණුවත් අල්ලලා බැම්ම ගහලා ඉවරයි. කුමන හෝ ආකාරයකින් ඔබට සන්තක නොවන දෙයක් ඔබ සන්තක කරගන්නවා නම්, භුක්ති විඳිනවා නම්, එය සොරකමක්.

පිංවතුනි, කාමමිච්ඡාචාරය, හැමෝම පැනලා යන මාතෘකාවක්. ඉස්කෝලේ උගන්නන කොටත් පැනලා යනවා. පිරිවෙන්වල අපට උගන්නන කොටත්, ලොකු

හාමුදුරුවෝ ඕකෙන් පැනලා ගියා. අපි බණ කියනකොටත්, අපි ඒකෙන් පැනලා යනවා.

නීත්‍යානුකූල නොවන කුමන හෝ ආකාරයකින් සිත, කය, වචනය කියන තුන්දොර පිනවන එක තමයි කාමමිච්ඡාචාරය කියන්නේ. වැරදි විදිහට පංචේන්ද්‍රියන් හෝ තිදොර පිනවන එක, මම සරල තැනකට එන්නම්. ඔබ, ඔබේ සැමියා හෝ බිරිඳ සමඟ එකතුව ඉන්නකොට සාදයකට ගිහිල්ලා, වෙනත් බිරිඳක් දිහා ඔබට දූෂ්‍ය සිතකින් බලන්න පුළුවන්. ඒ කාමමිච්ඡාචාරයයි. අපි දකිනවා, කාමමිච්ඡාචාරය කියන්නේ භෞතික ක්‍රියාවලියක්, ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් විතරයි කියලා.

පිංවතුනි, එය මානසික, වාචයික, කායික කියන ඔය තුනම නියෝජනය කරනවා. එයින් මිදෙන්නේ කොහොමද අපි? බාහිය සූත්‍රය කියවන්න ගිහිල්ලා. බාහිය සූත්‍රයේ තිබෙනවා මේ අනවශ්‍ය කෙලෙස් ක්‍රියාවලියෙන් අත මිදිලා නිවනට යන්නේ කොහොමද කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, බාහිය පංචේන්ද්‍රයන්ගෙන් දූෂ්‍ය නොවී ජීවත්වීමට හොඳ ක්‍රමය තමයි,

"දිට්ඨේ දිට්ඨ මත්තං බවිස්සති - මුතේ මුත මත්තං බවිස්සති
සුතේ සුත මත්තං බවිස්සති - විඤ්ඤානේ විඤ්ඤාණ මත්තං බවිස්සති"

දැන් මෙතන ශ්‍රී මහා බෝධි අංගනයේ සිල් අරගෙන ඉන්න, සිල් අරගත්ත කෙනෙක් ඔබ. ඇසට ක්ලේෂයක් විදිහට එන්න පුළුවන් ඒ වෙලාවට. දිට්ඨේ දිට්ඨ මත්තං බවිස්සති. දැක්ක දේ දැක්ක තැනම අත අරින්න. ගෙදර ගෙනියන්න ගියොත්, සීලෙත් නෑ, ගෙදරත් නෑ.

අපි දැක්ක තැන දැක්ක දේවල් අත අරිනවා පිංවතුනි. උදාහරණයක් හැටියට, ඔබ හැමදාම ගෙදර ඉඳලා වැඩට යන පාර මතක් කරගන්න. එහි හැමදාම බස්හෝල්ට් එකේ හම්බවෙන අය මතකද? නැද්ද? මතකයි. කාර්යාලෙදි හම්බවෙන අය මතකයි. පිංවතුනි, කාටද මතක ගෙදර ඉඳලා කාර්යාලෙට යනකම් තිබෙන ලයිට් කණු ටික? හාමුදුරුවනේ, ශ්‍රී මහා බෝධියට අපේ

ගෙදර ඉඳලා එනකොට ලයිට් කණු මෙච්චරක් තියෙනවා. කාටද මතක? ලයිට් කණු දැක්කේ නැද්ද? දැක්කා. මොකද මතක නැත්තේ? ආන්න... දිට්ටේ දිට්ටමත්තං. ඒ වෙලාවෙම අත ඇරියා. ඒ නිසා කසාද බැන්දට පස්සේ ඔබේ ඇසට එන හැම රූපයක්ම ලයිට් කණුවක් කියලා හිතලා ඉන්න පුළුවන් නම් හොඳයි. ඇසෙන් දකින්නා සේ දිව්‍ය ශරීරයෙන් දූෂ්‍ය නොවී ඉන්න.

මොකද කාමමිච්ඡාචාරය කියන්නේ අබ්‍රහ්මචරියා කියන එක නොවෙයි. නීත්‍යානුකූල නොවන චරිත. ඒ නිසා එතෙන්ට මම මේ උපදේශය දෙන්නේ. ඔබ විවාහකයෙක් නම්, ඊළඟට ඔබ විවාහ නොවුණත්, ඔබට ඒ සඳහා නීත්‍යානුකූල අයිතිවාසිකමක් නැත්නම්, ඔබේ ඇසට එන නපුරු හීන, නපුරු රූප, කෙලෙස්, දිට්ටේ දිට්ට මත්තං; දැක්ක තැන එතනම අතහරින්න. හරියට ඔබට මුණ ගැහෙන ලයිට් කණු එතනම අත ඇරලා එනවා වගේ. අපි කවුරුත් හිතනවද ලස්සන ලයිට් කණුවක්, විදුලිබල මණ්ඩලේ තියන මේක මගේම කරගන්න ඕනෙ කියලා, අරගෙන යනවද? ගෙදර ගෙනියන්නේ නෑ.

ඒ නිසා අතරමඟ හම්බවෙන ලයිට් කණු ගෙදර ගෙනියන්නේ නැතුව ඉන්න. එතකොට ඔබටත් හොඳයි. මණ්ඩලේටත් හොඳයි.

කාමමිච්ඡාචාරය කුමන හෝ වැරදි ආකාරයෙන් සිදුවන පංචේන්ද්‍රයන් හෝ තිදොරේ වැරදි පිනවීම, කාමමිච්ඡාචාරයයි. කාමමිච්ඡාචාරය යනු ජීවවිද්‍යාත්මක ක්‍රියාවලියක් පමණක් නොවේ.

වචනයෙන් අපි මොනවද කරන්නේ?

- බොරු කියනවා
- කේලාම් කියනවා
- හිස් වචන කියනවා
- රළු වචන කියනවා

බොරු කියන්නේ කුමක්ද? සලෙය්‍යපත සූත්‍රයේ විග්‍රහ කරනවා ලාභාපේක්ෂාවෙන් හෝ අනෙකා කෙරෙහි ද්වේශයෙන්, මිනිස්සු උසාවියට ගිහිල්ලා, අපි දන්න දේ දන්නේ නෑ කියනවා. නොදන්නා දේ දන්නවා කියනවා. දැන් නම් අලුත් එක, ගිහිල්ලා අමතකයි කියනවා. පිංවතුනි, අපි දන්න දේ දන්නෙ නෑ කිව්වාම, ඒක

බොරුවක් ද? නැද්ද? බොරුවක්. නොදන්නා දේ දන්නවා කියනවා ලාභාපේක්ෂාවෙන්. තමන් දන්නා දේ දන්නේ නෑ කියනවා. වෙන වචන පාවිච්චි කරනවා. ඒක බොරුවක්.

ඔබේ ආයතනයට වේවා, නීතිය ඉදිරියේ වේවා, සමාජය ඉදිරියේ වේවා, ඔබේ අම්මා, තාත්තා, ආච්චි, සීයා, ගෙදර සාමාජිකයින් ඉදිරියේ වේවා, තමාට හෝ අනෙකාට ලාභාපේක්ෂාවක් ලබාදීමේ අරමුණින් මිනිස්සු රවට්ටන්න එපා. බොරුව කියන්නේ පිංවතුනි, වචනයෙන් වෙන ප්‍රධාන වැරැද්දක්. අපි කියනවනේ, රට වටේ වැට බැන්දත් කට වටේ වැට බඳින්න බෑ කියලා. ඒ නිසා වචනයෙන් වැරදි හතරක් වෙනවා. ඊළඟ එක මොකක්ද?

කේළාම් කියන එක. ඔබේ දරුවා පන්තියේ දඟලනකොට පන්තිභාර ගුරුතුමී ඔබට එන්න කියලා කියනවා. ළමයා වැඩ කරන්නේ නෑ. හරිම දඟයි. මෙයා ගැන චුට්ටක් බලාගන්න කියලා. ඒක කේළමක්ද? නෙමෙයිද? නැහැ. ඇයි ඒ? අරමුණේ මූලිකත්වය මත තමයි කේළමක් ද නැද්ද කියලා තීරණය වෙන්නේ. ගුරුවරයෙක් ශිෂ්‍යයෙක් ගැන දෙමාපියන්ට කියන්නේ

දරුවෝ යහමඟට ගන්න. හැබැයි, ඒ ගුරුවරයාම වෙන අම්මා කෙනෙක් එක්ක ඕක කියනවා නම්, කේළමක් ද? නැද්ද? කේළමක්. පිංවතුනි, අපි දැන් අදාළ කෙනාට නෙමෙයි කියන්නේ. අදාළ කෙනාට නැතුව අනික් හැමෝටම කියනවා.

පිංවතුනි, තව කෙනෙකුට අයහපතක් කිරීමේ අරමුණින්, තව කෙනෙක්ගේ හොඳක් වෙන්න පුළුවන්, නරකක් වෙන්න පුළුවන්. වෙනත් පුද්ගලයෙක් සමඟ පවසන එක තමයි කේළම. අපි යම්කිසි දෙයක් කියනකොට, කරනකොට, ඒ සඳහා තියෙන මානසික බලපෑම තමයි මෙතනදි වැදගත් වෙන්නේ.

ඊළඟට හිස් වචන. දැං අද සිල් ගන්න ඇවිල්ලා, ඊයේ පෙරේදා ගෙළ වැළලාගෙන මියගිය කෙනෙක් ගැන කතා වෙනවා. අනේ බලන්නකෝ, අපරාදේ නේද කියලා. මිය ගිය කෙනාට වැඩක් තියෙනවද? අහන කෙනාට වැඩක් තියෙනවද? කියන කෙනාට වැඩක් තියෙනවද? නෑ පිංවතුනි.

අපේ ආයතනවලට බොරු කියනවා අඩුයි. වැඩියෙන්ම කතා වෙන්නේ හිස් වචනයි, ඕපදූපයි, කේළමුයි.

පිංවතුනි, මෙලොවටත්, පරලොවටත් නැත්නම්, තමන්ටත්, අනුන්ටත් තේරුමක් නැති දේවල් තමයි හිස් වචන. කියන කෙනාට වැඩකුත් නෑ. අහන කෙනාට වැඩකුත් නෑ. මෙලොවට වැඩකුත් නෑ. පරලොවට වැඩකුත් නෑ. හිස් වචනයක්.

රළු වචනයක් කියන්නේ මොකක්ද? අනිත් අය අහන්න අකැමැති දේවල්. මොකද අපි කියනවා රළු වචන කියන්නේ අසභ්‍ය වචන විතරයි කියලා. නෑ. දැං ඔය අපේ භාෂාවේ තියනවනේ හින්ට් පාස් කරනවා කියලා දේකුත්. මං දන්නේ නෑ ඒකට කියන උපභාෂා වචනය. මොකද අපි ඒවා වැඩිය කරන්නේ නැති නිසා හින්ට් කියන වචනේ විතරයි දන්නේ. ඇනුම්පද කියනවා. උදාහරණයක් විදිහට අල්ලපු ගෙදර ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඒගොල්ලෝ කොහෙන් හරි නරක විදිහට සල්ලි හොයාගෙන ලොකු වාහනයක් අරගෙන, ඒ ගෙදර කට්ටියත් ඉන්න තැනක මේ ගෙදර කට්ටිය කියනවා, "අපි නම් ඉතින් තාම බස් එකේ යන්නේ, අපිට ඉතින් ඔය එහෙන් මෙහෙන් හම්බවෙන සල්ලි නැනේ". පිංවතුනි, අරමුණ මොකක්ද? රිදවීම. එතකොට අසභ්‍ය වචනකත් අරමුණ මොකක්ද? රිදවීම. මිනිස්සු රිදවන,

ආතතියට, දුකට පත්කරන වචන තමයි රළු වචන. ඒක අසභ්‍ය වචනයක සිට ඕනෑම තත්ත්වයක් කරා ගමන් කරන්න පුළුවන්.

ඊළඟට පිංවතුනි, ඕපාදූප. මා කියන්න ඕන නෑනේ අලුතින්. පිංවත්නි, අනුන්ගේ දේ සාකච්ඡා කිරීම. දැං ඔන්න ශිෂ්‍යත්ව ප්‍රතිඵල ආවා. ඊයේ රෑ ආවා නේද? දැං මෙතන ඉන්න සමහර අම්මලාට තමන්ගේ ළමයාගේ ලකුණු කෙසේ වෙතත් වටේ ඉන්න ළමයින්ගේ ලකුණු කටපාඩම් ඇති. සමහර අය ඉස්සෙල්ලාම බලන්නේ අල්ලපු ගෙදර එක්කෙනාගේ ලකුණු. හොයලා බලන්නේ එයා ශිෂ්‍යත්වය පාස් ද කියලා. පිංවත්නි, හොඳ හෝ නරක වශයෙන් බෙදිලා අපි හරියට අනිත් අයගේ දේවල් කතා වෙනවා.

අල්ලපු ගෙදර මිනිස්සු රණ්ඩු වෙනවා ඇහුණොත්, ලයිට් එකත් නිවලා, ටීවී එකත් නිවලා, සර්පයෝ කන්නත් පුළුවන්, මදුරුවෝ කන්නත් පුළුවන්, සියලුම අවදානම් අරගෙන දෙන්නත් එක්ක වැටමුල්ලට වෙලා, අහගෙන ඉන්නවා මොනවද කියන්නෙ කියලා. නමුත් ගෙදර ආපු මහත්තයටයි නෝනටයි තමන්ගේ දේකට දෙන්නට

දෙන්නා ඇහුම්කන් දීගන්න වෙලාවක් නෑ. දරුවන්ගේ ප්‍රශ්නෙකට ඇහුම්කන් දීගන්න වෙලාවක් නෑ.

හවසට අර විසඳන්නේ ඉන්දියාවේ ප්‍රශ්න. ඉන්දියාවේ ප්‍රශ්නවලට තමයි ලංකාවේ ගොඩක් අය ටීවී එක ඉස්සරහ ඉඳලා විසඳුම් දෙන්නේ. විවාහ නැතිකම, විවාහ කල්යාම, දරුවෝ නැතිකම ගැන තමයි උදේ සවස තැවෙමින්, දැවෙමින් ඉන්නේ. මේ ගෙදර පිච්චිලා යනවා පේන්නේ නෑ.ඒ නිසා, ප්‍රාණඝාතය, කාමමිච්ඡාචාරය, සොරකම් කිරීම, කේළාම් කියන එක, බොරු කියන එක, රළු වචන කියන එක, හිස්වචන කියන එක, මේවා කායික, වාචසික වැරදි 07යි. ඊළඟට මොනවද පිංවතුනි? මානසික මොනවද?

- ලෝභය
- තරහව
- මිථ්‍යාදෘෂ්ටිය

ලෝභය කියන්නේ පිංවතුනි, මෙහි ලෝභය හා මසුරුකම කියලා අදහස් දෙකක් තියෙනවා. ලෝභයාගේ ලක්ෂණය තමයි අනිත් අයගේ දේවල් පුළුවන් තරම් එකතු කරන්, තමන් භුක්ති විඳිනවා. මසුරාගේ ලක්ෂණය තමයි තමන් භුක්ති විඳින්නෙත් නෑ.

අනිත් අයට දෙන්නෙත් නෑ. එතකොට ලෝභයාට වඩා මසුරා භයානකද නැද්ද? භයානකයි. මොකද එයත් පාවිච්චි කරන්නේ නැනේ. ඕන තරම් එහෙම අය ඉන්නවා.

හොඳ ලක්ෂ ගණන් වටින වාහන තියෙනවා. ගරාජ් එකෙන් එළියට ගන්නේ නෑ. අපි තෙමෙනවා. වාහනේ තෙමෙන්නේ නෑ. ගෙදර සෝෆා සෙට් එක ගෙනැල්ලා ඉටිකොලේ කඩන්නේ නැතුව අවුරුදු 5ක් විතර තියාගන්නවා. ඉඳගන්න දෙන්නෙත් නෑ. ඊළඟට ගෙදරකට ෆ්‍රිජ් එකක් ගෙනාවම සෑජිෆෝම් කෑල්ලේ ඉඳලා පෙට්ටගම් බැඳ බැඳ හැමතැනම දානවා. වැඩකට ගන්නෙත් නෑ. කාටවත් දෙන්නෙත් නෑ. විසිකරන්නෙත් නෑ. මේවා මසුරු කම. පිංවතුනි.

ඒවගේම තරහව. අපි අනික් අයගේ දේවල් සන්තක කරගන්න තියන දැඩි ආශාව සහ අනික් අයට පරිත්‍යාග නොකරන ස්වභාවය. මේක ඇතුළේ තියෙනවා ද්වේශය, ක්‍රෝධය, වෛරය, උද්දච්ඡකම. අපි සමහර කට්ටිය ඉන්නවා පිංවත්නි, හරියට තරහා යනවා. හැම දෙයක් දිහාම බලන්නේ ද්වේශයෙන්. කවුරු හරි සිල් ගන්න ආවත් ද්වේශයෙන් බලනවා. ආවේ නැතත්

ද්වේශයෙන් බලනවා. මහත්තයා කල් ඇතිව ආවත් ද්වේශයෙන් බලනවා. පරක්කුවෙලා ආවත් ද්වේශයෙන් බලනවා. කෑම උයලා තිබ්බත් ද්වේශය. නැතත් ද්වේශය. පිංවත්නි, ආණ්ඩුව මොන වැඩේ කළත් බනිනවා. ආණ්ඩුව මොන වැඩේ නොකළත් බනිනවා. හාමුදුරුවන්ටත් බනිනවා. දේශපාලනඥයන්ටත් බනිනවා. නෝනටත් බනිනවා. ළමයින්ටත් බනිනවා. රූපවාහිනියටත් බනිනවා. ඔක්කොටොම බනින එකමයි වැඩේ.

සමහරු ඉන්නවා, කවදාවත්යම්කිසි දෙයක හොඳක් දකින්න කැමති නෑ. ද්වේශයේම වෙළිලා ඉන්නවා. පිංවතුනි, මේ තරහවේ ඉන්න කෙනා බොහෝම අප්‍රසන්න කෙනෙක්. මේ ද්වේශයට, පටිඝයට පත්වෙච්ච කෙනා. පිංවතුනි,

දැන් අපේ වචන තුනක් තියෙනවා, handsome, beautiful, attraction කියලා. අපේ නෙමෙයි. ඒවා අපේ වචන වගේ තමයි. දැන්, ඇයි ඒවනේ දන්නේ. පිංවතුනි, කඩවසම් බව, සුරූපී බව හා ආකර්ශනීය බව, මේ සුරූපි බව හා කඩවසම් බව කියන එක ජීවවිද්‍යාත්මකී. ඒක නැත්නම්, හදන්නත් පුළුවන්, දැං.

"ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං" කියන මේ හතරටම විද්‍යාවනේ මැදිහත් වෙලා තියෙන්නේ. දැං ඉස්සර වගේ ඉපදීම දුකක් නෙමෙයි. දුක නැති කරන්න බෑ. දුක අඩුකරලා තියෙනවා.

ජරාපි දුක්ඛා. ලෙඩ වෙන එක දුකක්. දිරන එක දුකක්. ඇත්තටම ඇතුළින් සුදු, පිටින් කළු කොණ්ඩ තියන අම්මලා නැද්ද මෙතන. ඔබට ඒක හදලා දුන්නේ කව්ද? විද්‍යාව. එතකොට ඇතුළින් සුදු තියෙන කොණ්ඩෙට උඩින් කළු පාට ගාලා, අපිම සන්තෝෂ වෙනවා, කළු කොණ්ඩයක් කියලා. අපිම දන්නවා නේද, පොට් ඇදලා, දෙදාර කොලෙන් ඇදලා වහලා තියෙන්නේ කියලා? විද්‍යාව එතකොට මේ දිරන එකට මැදිහත් වෙලාද නැද්ද? මැදිහත් වෙලා ඔබවයි ලෝකයාවයි රවට්ටන්න. හැබැයි ඇතුළෙන් දිරන වැඩේ යනවා.

ව්‍යාධිපි දුක්ඛෝ. දැන් ඉස්සර වගේ වසංගත හැදුණාම මිනිස්සු ලක්ෂ ගණන් මැරෙන්නේ නැහැ. බෙහෙත් තියෙනවා. හැබැයි වසංගත හැදෙන එක නතර වෙන්නෙත් නෑ. ලෙඩ වෙන එක නතර වෙන්නෙත් නෑ. නමුත්, ඒ කෙළවර මැරෙන එක නතර වෙන්නෙත්

නෑ. නමුත්, කල් දාගන්න විද්‍යාව උදව් කරලා තියෙනවා.

ඊළඟට, මරණම්පි දුක්ඛං. මරණයත් කල් දාගන්න විද්‍යාව උදව් වෙනවා. ඒ නිසා විද්‍යාව මේ හතරට මැදිහත් වෙලා ඉන්නේ. හැබැයි මේගොල්ලොන්ට මේකට ස්ථිර විසඳුමක් දෙන්න බැරි වෙලා තියෙනවා.

"අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියේහි විප්පයෝගෝ දුක්ඛො, යම්පිච්චං නලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපදානක්ඛන්ධා දුක්ඛා" මේ තුනට මැදිහත් වෙන්නේ මොකක්ද? කලාව.

අකැමැති අයත් එක්ක ඉන්න වුණාට කැමැති අයව නැති වුණාම, කැමැති දේවල් හම්බ වුණේ නැති වුණාමයි ඇතිවන දුක ගොඩක් වෙලාවට නැතිකර ගන්නේ සාහිත්‍ය කලාවෙන්. සිංදුවක් අහනවා. දැං තියෙන ඒවා ඇහුවම දුක නැති වෙනවා නෙමෙයි, ඉන්න තැනිනුත් පල්ලෙහාට වැටෙනවා. මොකද දුක නැති කරන්න මිනිස්සු සිංදුවක් ඇහුවට, ඒ මිනිස්සු ඊට වඩා දුක් කන්දක ඉන්න බව තේරෙනවා. ඒ ගීත ඇහුවම අපට හිතෙනවා, ඒගොල්ලොන්ට ගීතයක් ලියලා දෙන්න.

අනේ මේක අහලවත් ඕගොල්ලෝ සතුටින් ඉන්න, අනේ අපි ගැන හිතලා ඔච්චර දුක් වෙන්න එපා කියලා. ඊළඟට නාට්‍යයක් බැලුවම දුක වැඩිවෙයි. මේ ටෙලිනාට්‍යවල තියෙන ප්‍රශ්න කන්දරාව දිහා බැලුවහම. නමුත් සාහිත්‍ය කලාව තමයි මිනිසුන්ගේ මේ දුක්වලට යම් විදිහකින් මැදිහත් වුණේ.

"සංඛිත්තේන පඤ්චුපදානක්ඛන්ධා දුක්ඛා" කිසිම කෙනෙකුට තාවකාලික විසඳුමක්වත් හොයාගන්න බැරිවුණා, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධයේම දුකට.

ඒ නිසා අන්තිමට මිත්‍යාදෘෂ්ටිය.මිත්‍යාදෘෂ්ටිය කියන්නේ වැරදි දෘෂ්ටිය. පිංවතුනි, මොනවද වැරදි දෘෂ්ටි? හොඳ කියලා දෙයක් නෑ, නරක කියලා දෙයක් නෑ. අම්මට තාත්තට සලකන එක වැඩක් නෑ. දුන් දේ පලවිපාක නෑ. මහණ බමුණන්ට සලකන එක වැඩක් නෑ, මැරිලා ආපහු ඉපදෙන්නේ නෑ. කරපු දේවල්වල පලවිපාක නෑ. මේ හත.

ඔබේ ජීවිතේට හම්බවෙලා නැද්ද? "වැඩක් තියෙනවද ඔය කඨින පිංකම් කරලා?" කියන අය. එතකොට

කොහේ ගිහිල්ලද ඉපදෙන්නේ? ඔබ ද්වේශයට පත් වෙන්න ඕනෑද ඒ අයත් එක්ක වාද කරලා? නෑ. ඇයි? ඔවුන් මැරිලා ඉපදෙන තැන අපට පේනවා. පන්සල් ගිහින් වැඩක් නෑ කියන අය නැද්ද? සිල් ගන්න ගිහින් වැඩක් නෑ කියන අය නැද්ද? භාවනා කරන්න ගිහින් වැඩක් නෑ කියන අය නැද්ද? අම්මට තාත්තට සලකලා ඇති වැඩේ මොකද්ද කියන අය නැද්ද? මැරිලා ඉපදෙන්නෙ නෑ කියන අය නැද්ද? ඉන්නවා පිංවතුනි.

"ජරං මරණං දුග්ගතිං නිරයං පිනිමාදං උප්පජ්ජන්ති" මැරිලා අපාය ආදී ඉතාම දුක්ඛිත ලෝකවල ඉපදෙනවා මිත්‍යාදෘෂ්ටික අය. ඒ නිසා පිංවතුනි මේ දෘෂ්ටිවාද දෙක, ප්‍රාණඝාතය, හොරකම, කාමමිච්ඡාචාරය, බොරු කීම, කේළාම් කීම, හිස්වචන කීම, රළු වචන කීම, තරහව, මිත්‍යාදෘෂ්ටිය, ලෝභකම කියන මේ දහය නැති කෙනා, "පරං මරණං සුග්ගතිං උප්පජන්ති". මේ දහය නැති කෙනා උඩහ ඉපදෙනවා. මේ දහය ඇති කෙනා පහළ ඉපදෙනවා. මේක තමයි සලෙය්‍යක සූත්‍රය.

මං තව පුංචි කතාවක් කියන්නම්. මිනිත්තු තුනකින් මගේ අනුශාසනාව අවසන් වෙනවා. ඒක තමයි

පිංවතුනි, මේ දිව්‍ය ලෝකය හා අපාය කියන දෙක ඉස්සෙල්ලම හොයාගන්න ඕන අපි ගාව.

එක දවසක් සෙන් හාමුදුරු නමක් ඇවිල්ලා ලොකු හාමුදුරුවන්ට, "ලොකු හාමුදුරුවනේ, අම්මා, තාත්තා, හොඳ, නරක, බුදුහාමුදුරුවෝ, දෙවියෝ, දිව්‍යලෝක, අපාය, මේ ඔක්කොම බොරු"හයියෙන් කියාගෙන කියාගෙන ගියා. ලොකු හාමුදුරුවෝ තමන් ළඟ තිබ්බ හැරමිට්ට අරගෙන ගෝලයට ගැහුවා හැරමිට්ට දෙකට කැඩෙන්න.

අර විශාල තැන්පත් කමක් තිබ්බ හාමුදුරුවෝ කේන්තියට පත්වෙලා. රුධිර සංසරණ පද්ධතිය වේගවත් වෙලා. ඇස් රතු වෙලා. වෙව්ලන්නට පටන් ගත්තා. ලොකු හාමුදුරුවෝ ගෝලයාට කිව්වා ගිහිල්ලා ඔය කේන්තිය ආපු තැන හොයගෙන එන්න. පොඩි හාමුදුරුවෝ කාමරයට ගිහිල්ලා තිබුණු බඩු මුට්ටු ඔක්කෝම පොළොවේ ගැහුවා. ඇයි, ඒ කේන්තියට. ඊළඟට ඇඬුවා. ඒ මොකක්ද කළේ? කේන්තිය පිට කළා.

බඩු මුට්ටු හැම තැනම විසිරුණු කාමරය මැද ඉඳගෙන, ඇස් දෙක පියාගෙන කල්පනා කළා කේන්තිය කොහෙන්ද ආවේ. පිංවතුනි, කේන්තිය තියෙන්නේ පිටද? අපි ගාවද? හොඳ තියෙන්නේ පිටද? අපි ගාවද? මෛත්‍රිය තියෙන්නේ පිටද? අපි ගාවද? නරක තියෙන්නේ පිටද? අපි ගාවද? කරුණාව තියෙන්නේ පිටද? අපි ගාවද? අපි ගාව පිංවත්නි. ඔබ කියනවා ඒ දේ නිසා තමයි මට කේන්ති ගියේ කියලා. ඒ කියන්නේ මොකක්ද? ලුණු ආවා. ලුණු රස වුණා. පුංචි හාමුදුරුවෝ පටන් ගත්තා කල්පනා කරන්න. තමන්ගේ දිහා බලන්න පටන් ගත්තා. මෙච්චර කල් ලෝකය දිහානේ බැලුවේ.

අපි පිංවතුනි, වෙනස් කරන්න කියන්නේ ලෝකය. හැබැයි වෙනස් වෙන්න ඕන කවුද? අපි. වෙනස් කරන්න එපා ඔබේ බිරිඳ. වෙනස් වෙන්න ඔබ. වෙනස් කරන්න එපා ඔබේ සැමියාව. වෙනස් වෙන්න ඔබ. වෙනස් කරන්න යන්න එපා ඔබේ දරුවාව. වෙනස් වෙන්න ඔබ. එතකොට ලෝකයම වෙනස් වෙයි.

පිංවතුනි, මේ පුංචි හාමුදුරුවෝ සිත දියුණු කරමින් භාවනා කරන්න පටන් ගත්තා. පුංචි හාමුදුරුවන්ට

පේනවා ඇත්තටම මේ ඔක්කෝම තියෙන්නේ අපි ගාව බව. දිව්‍ය ලෝකයත් අපි ගාව. අපායත් අපි ගාව. හොඳත් අපි ගාව. නරකත් අපි ගාව. ගුණවත්කමත් අපි ගාව. කුසලුත් අපි ගාව. අකුසලුත් අපි ගාව. මෛත්‍රිය තියෙන්නෙත් අපි ගාව.

ඒ නිසා, අද ඉඳලා ගිහිල්ලා අවුස්සන්න. කවුද? ඔබව. අද ඉඳලා සුද්ද කරන්න, ඔබව. ආනාපාන සතිය. ආශ්වාසය, ප්‍රශ්වාසය. භාවනාවෙන් කරන්නේ මොකක්ද? ආශ්වාසය, ප්‍රශ්වාසය අරමුණු කරගෙන අස්පස් කරනවා. කොහෙද? මනස. ගෙයක් අස්පස් කරලා පිළිවෙලකට හදනවා. ඒවගේම ඔබේ මනසත් අස්පස් කරන්න පටන් ගන්න. ඔබ ඇතුළේ හොයන්න සුගති මාර්ගය හා දුගති මාර්ගය. මරණින් මතු දුගති මාර්ගයේ නොඉපදීමට නම්, මේ දස දුෂ්චරිතය සිදු නොකරන්න. මරණින් මතු සුගතිගාමී වීමට නම්, දස සුචරිතයේ යෙදෙන්න. කෙළවර අපි කාටත් නිර්වාණයම සාක්ෂාත් වේවායි කියලා සාධුකාරයක් පවත්වන්න.

සාධු ! සාධු !සාධු !

ධර්ම පරිශ්කාරක පූජා කිරීම...

දෙවියන්ට පිං දීම...

සාධු ! සාධු !සාධු !

26.10.2017